# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

| සිංහල | 2 වසර | කාලය පැය 2 යි |
|---|---|---|

* පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

    I. කළගුණ සලකමු
    II. සුන්දර සිරිලක
    III. මිහිඳු මහරහතන් වහන්සේ
    IV. මා පිරිවෙනට පැමිණි පළමු දින
    V. මා කියවූ රසවත් ම පොත (ලකුණු 25යි)

02. (අ) පහත සඳහන් බැඳි අකුරු සඳහා වචන 02 බැගින් වචන 10 ක් ලියන්න

    ඬ , ක්‍ෂ , ප්‍ර, ඛ්‍ය , ම්‍ (ලකුණු 10යි)

    (ආ) වර්ගාන්තාක්ෂර 5 ලියා දක්වන්න (ලකුණු 05යි)

The National e-Learning Portal for the General Education

03. (අ) ජාති , ද්‍රව්‍ය , ගුණ, ක්‍රියා , සංඥා යන නාම වර්ග 5ට උදාහරණ නාම පදය බැගින් දක්වන්න

    (ආ) පූර්ව ක්‍රියා , මිශ්‍රක්‍රියා , විධි ක්‍රියා , ප්‍රයෝජ්‍ය ක්‍රියා , ආශීර්වාද ක්‍රියා යන ක්‍රියා වර්ග පහට නිදසුන් වාක්‍ය 5ක් ලියා දක්වන්න. (ලකුණු 10යි)

04. (අ) පහත සඳහන් ඡේදයේ ඇති නිපාත පද 5ක් හා උපසර්ග සහිත පද 5 ක් උපුටා දක්වන්න

    දවස පුරා පරිසරයේ පැවති සසල බව නිසල විය. සුසුදු වලාවන් අතරින් සඳරැස් වැටෙන්නට විය. ඒ සඳරැස් අවට පැතිර යන විට ආරාම භූමිය තුළ රැස්ව සිටි සෑම උවසු උවැසියෙකුම ඉමිහිරි නදින් සාධුකාර නගන්නට පටන්ගත්තේ නාහිමිපාණන් වහන්සේ විසින් පවත්වන්නට නියමිත අතිමධුර දම්දෙසුමට දෙසවන් යොමුකරනු රිසියෙනි. (ලකුණු10යි)

    (ආ) පහත සඳහන් පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

    හිස , ලෝකය , ජලය , රාත්‍රිය , සඳ (ලකුණු 05යි)

05. (අ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න

I. සිංහයා මුවා මරයි.
II. මව දරුවා නලවයි.
III. සභාපති තුමා සභාව අමතයි.
IV. දෙමව්පියෝ දරුවන් පාසල් යවති.
V. ගොවියා කුඹුර කොටයි. (ලකුණු 10යි)

(ආ) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

I. රජු රට පාලනය කරයි.
II. මම ගමට යමි.
III. නායකවරු සභාව අමතති.
IV. අපි මාර්ග නීති කඩ නොකරමු.
V. ව්‍යාපාරිකයා පාරිභෝගිකයන්ට බඩු විකුණයි (ලකුණු 05යි)

06. (අ) "ගිරා"ශබ්දය සියලු විභක්තිවල වරනගන්න. (ලකුණු 10යි)

(ආ) "ලබ"ලැබීමේ ධාතුව පුරුෂ තුනේ වර්තමාන කාලයේ වරනගන්න. (ලකුණු 05යි)

07. රෝහිණී නවකතාව ඉතිහාස තොරතුරු සපයන කෘතියකි." නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

08. සුභාෂිතයේ ඔබ කැමති කවි තුනක් අර්ථ සහිත ව ලියා දක්වන්න. (ලකුණු 15යි)

09. කථාමෘතයේ සඳහන් ඔබ කැමති කතාවක් සැකවින් ගෙනහැර දක්වන්න. (ලකුණු 15යි)